ගල්ගමුව ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
---------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 15 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 23 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 ජූලි 14 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

**1.2** <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

**1.3.1** <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.2,585,889 ක සේවක ණය ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි එය රු.2,619,048 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.33,159 ක් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) ජර්නල් සටහන් අංක 30 මඟින් පොදු සැපයුම් ණය හිමි ගිණුමට හරකර තිබුණු රු.125,000 ක මුදල එම ගිණුමට හර නොකර විවිධ ණය හිමියෝ ගිණුමට හරකර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු හඳුනාගත නොහැකි රු.7,797,390 ක කර්මාන්ත ණය ගැති ශේෂ 107 ක් නිසි අනුමැතියකින් තොරව කපා හැරීමෙන් සමුච්චිත අරමුදල හා කර්මාන්ත ණය ගැතියන් එම වටිනාකමින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 03 කට අදාලව පැවති ශේෂයන් හා ඒවාට අදාළ උපයෝගී ලේඛනවල පැවති ශේෂයන් අතර රු.382,839 ක නොසැසඳීම් අනාවරණය වී තිබුණි.

### 1.3.3 ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) රු.4,816,542 ක මෝටර් ග්‍රේඩර් ණයගැති ගිණුම තුළ වසර 3 ක කාලය ඉක්මවා අය නොවී තිබුණු ශේෂවල වටිනාකම රු.1,995,496 ක විය.

(ii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අයවීමට තිබුණු රු.762,022 ක කඩ කුලියෙන් රු.503,729 ක් 2010 වර්ෂයට පෙර සිට හිඟව පවතින ශේෂ 39 කින් සමන්විත වී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අයවීමට හිඟව තිබුණු රු.237,600 ක් වූ වරිපනම් බදු වසර 02 සිට වසර 20 දක්වා කාල පරාසයක් තුළ අයවීම හිඟහිට තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ රු.772,983 ක ටෙන්ඩර් ගාස්තුවලින් රු.254,651 ක් හෙවත් සියයට 33 ක් වසර 02 සිට වසර 05 දක්වා කාල පරාසයක් තුළ හිඟව පැවතුණි.

(v) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ගිවිසුම් ඇප තැන්පතු රු.1,603,426 ක් වූ අතර ඉන් රු.866,309 ක් හෙවත් සියයට 54 ක් වසර 02 සිට වසර 12 දක්වා කාල පරාසයක සිට හිඟව පැවතුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට වසර 01 සිට වසර 12 දක්වා කාල පරාසයක් තුළ නිරවුල් නොකළ රු.1,966,732 ක් වූ විවිධ තැන්පතු ශේෂ 196 ක් පැවතුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේ සේවක ණය හා අත්තිකාරම් යටතේ ගිණුම්ගතව තිබුණු රු.250,000 ක ශේෂය සනාථ කර ගැනීම සඳහා උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි.

## 1.3.5 නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

2010 වර්ෂයේ සිට පැවත එන වසර 2 ක් ඉක්මවූ රු.1,927,232 ක් ගෙවිය යුතු තැන්පතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 02 මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.15,557,272 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.7,068,168 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,489,104 ක වර්ධනයක් දක්නට ලැබුණි. මෙකී මෙහෙයුම් ප්‍රතිඵලයට රු.15,358,145 ක් වූ ප්‍රාග්ධන ලැබීම් හා රු.72,844,998 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රතිඵලය රු.41,929,581 ක ඌනතාවයක් බවට පත්ව තිබුණි.

## 2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළ තත්‍ය ආදායම, වියදම හා අදාළ විචලනයන් පහත පරිදි විය.

| | ආදායම් ප්‍රභවය | ආදායම 2015 | ආදායම 2014 | විචලනය | වියදම් විෂයය | වියදම 2015 | වියදම 2014 | විචලනය |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | | රු.000 | රු.000 | රු.000 |
| (i) | උත්පාදිත ආදායම | 19,556 | 19,933 | (377) | පෞද්ගලික පඩිනඩි | 50,147 | 37,188 | 12,959 |
| (ii) | වෙනත් | 68,461 | 48,849 | 19,612 | අනෙකුත් | 22,313 | 24,526 | (2,213) |
| | උප එකතුව | 88,017 | 68,782 | 19,235 | උප එකතුව | 72,460 | 61,714 | 10,746 |
| (iii) | ප්‍රාග්ධන ආදායම | 15,358 | 57,815 | 42,457 | ප්‍රාග්ධන වියදම | 72,845 | 66,227 | 6,618 |
| | මුළු එකතුව | 103,375 | 126,597 | 23,222 | මුළු එකතුව | 145,305 | 127,941 | 17,364 |
| | මෙහෙයුම් අතිරික්තය | 15,557 | 7,068 | 8,489 | අතිරික්තය/ ඌණතාවය | (41,930) | (1,344) | (43,274) |

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.88,016,946 න් සියයට 78 ක් හෙවත් රු.68,460,663 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.15,358,145 ක මුළු ආදායම ගම නැගුම, මග නැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මඟින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල් වලින් සමන්විත විය.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම හා හිඟ ආදායම පහත පරිදි විය.

| | ආදායම් විෂයය | 2014 ඇස්තමේන්තුගත | 2014 තථ්‍ය | 2014 දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය | 2015 ඇස්තමේන්තුගත | 2015 තත්‍ය | 2015 දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 1,018 | 1,192 | 300 | 1,230 | 1,201 | 473 |
| (ii) | බදුකුලී | 9,620 | 10,083 | 880 | 8,400 | 5,852 | 2,021 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,322 | 2,322 | - | 2,340 | 2,224 | - |
| (iv) | වෙනත් ආදායම් | 65,190 | 76,665 | 11,658 | 60,854 | 52,534 | 15,916 |
| | එකතුව | 78,150 | 90,262 | 12,838 | 72,824 | 61,811 | 18,410 |

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී බදු ගිවිසුම ප්‍රකාරව ප්‍රමාද වූ බදු මුදල් සඳහා ආරක්ෂිත ඇප හිලව් කිරීමේදී අයකළ යුතු රු.8,122 ක අධි ගාස්තුවක් අයකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ අයවිය යුතු හිඟ මස් කඩ බදු කුලී ආදායම රු.114,465 ක් විය.

(ඇ) හිඟ බදු කුලී ලේඛනය අනුව 2009 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වත්කම් 13 ක් වෙනුවෙන් රු.892,487 ක හිඟ බදු කුලී ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටද පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට කඩ කාමර 21 කින් රු.4,059,522 ක පෙර ගෙවුම් මුදල් (කීමනි) වසර 2-3 කාලයක සිට අයවීමට තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට කඩ කුලී ලේඛනය අනුව රු.824,142 ක කඩ කුලී ශේෂ 90 ක් වසර 01 – 05 දක්වා කාල සීමාවක් තුළ හිඟව පැවතුණි.

(ඊ) සභාබල ප්‍රදේශ තුළ දුරකතන සම්ප්‍රේෂණ කුළුණු 22 ක් පැවතියද ඒ සඳහා සංවර්ධන බලපත්‍ර, අනුකූලතා සහතික ලබාගෙන නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ බලපත්‍ර ගාස්තුද ලබාගෙන නොතිබුණි.

(උ) ගල්ගමුව පොදු වෙළඳ පොළ කඩ කාමර 37 න් කඩ කාමර 12 ක් එකවර ගෙවීමේ ක්‍රමයට බදු දීම සඳහා 2012 මාර්තු 06 දින දක්වා ටෙන්ඩර් කර රු.9,614,644 කට ලබා දී තිබූ අතර ඒ පිළිබඳ ලේඛන නිසි පරිදි නඩත්තු කර නොතිබීම මත අයවූ මුදල් හා හිඟ ප්‍රමාණයන් නිශ්චිතව හඳුනාගත නොහැකි විය.

## 03. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

### 3.1 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

ප්‍රාදේශීය සභාවේ සේවය කර විශ්‍රාම ගන්වා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයින් වෙනුවෙන් සභාව විසින් එම අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම අරමුදලට ගෙවිය යුතු ශේෂය රු.2,246,901 ක්ව තිබුණි. එමෙන්ම සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු රු.59,318 ක මුදල කුමන සේවකයින්ට අදාළවද යන්න පිළිබඳව සභාව දැනුවත් වී නොතිබුණි.

### 3.2 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ ගම නැගුම විශේෂ ව්‍යාපෘතිය යටතේ රු.1,400,000 ක ප්‍රතිපාදනය මත පෙර පාසැල් 28 ක් සඳහා පෙර පාසැල් උපකරණ ලබාදීමේ ව්‍යාපෘතිය සභාව මගින් කොන්ත්‍රාත් ක්‍රමයට ක්‍රියාත්මක කර තිබූ අතර පෙර පාසැල් 28 න් 06 ක් සඳහා පමණක් ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් විසින් මුදල් ප්‍රතිපාදන ලබාදී තිබුණි. ප්‍රාදේශීය ලේකම්ගේ 2015 දෙසැම්බර් 29 දිනැති අංක 403/01/01/08/2014 ලිපිය පරිදි සපයා ඇති ක්‍රීඩා උපකරණ ප්‍රමිතියෙන් තොර හා සැලසුම් හා උපදෙස්වලින් තොර බැවින් ඉතිරි උපකරණ 22 ක් සඳහා මුදල් ප්‍රතිපාදන සැපයිය නොහැකි බව දන්වා තිබුණද සභාව විසින් අදාළ

පෙර පාසල් 11 කට උපකරණ 11 ක් මිලදී ගැනීම සඳහා රු. 485,100 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ආ) 2016 මාර්තු 31 දින පෙර පාසැල් 06 ක ක්‍රීඩා උපකරණ භෞතිකව පරීක්ෂා කිරීමේදී පෙර පාසැල් දෙකක මෙරිගෝ රවුම්වල පැස්සුම් වලින් කම්බි ගැලවී පාවිච්චියට ගත නොහැකි තත්ත්වයක පැවතුණි.

**04 <u>යහපාලනය හා ගිණුම් කටයුතුභාවය</u>**

**4.1 <u>වත්කම් කළමනාකරණය</u>**

**<u>නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්</u>**

අංක 49-1976 දරන මිනි කුබෝටා ට්‍රැක්ටරය වසර 06 ක පමණ කාලයක සිට භාවිතයට නොගෙන කාර්යාල පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

**05. <u>පද්ධති හා පාලනය</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය